# 32
# පොළොන්නරු සඳකඩපහණේ ආකෘතියේ සුවිශේෂී ලක්ෂණ

*කේ. ඒ. එල්. කේ. දුලංගා* [1]
*එස්. කේ. එස්. විජේතුංග* [2]
HS/2013/0201, HS/2013/1183

මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ පොළොන්නරු රාජධානියට අයත් සඳකඩපහණේ ආකෘතියේ දැකිය හැකි විශේෂ ලක්ෂණ විමර්ශනය කිරීමයි. මේ සඳහා ප්‍රාථමික මෙන් ම නූතන මූලාශ්‍ර කිහිපයක් ද ක්ෂේත්‍ර අධ්‍යයනයක් ද සිදුකරන ලදි. මෙම යුගයේ සඳකඩපහණ, අනුරාධපුර යුගයේ සඳකඩපහණෙහි දක්නට ලැබූ අර්ධ වෘත්තාකාර පෙනුම වෙනස් වී එහි පළල ප්‍රමාණය වැඩිවීමක් දක්නට ඇත. එසේ ම අනුරාධපුර යුගයේ සඳකඩපහණෙහි දක්නට ලැබුණු ඇත්, අස්, ගව, සිංහ යන එකෙකු පිටුපස දිවෙන සත්ත්ව පේළිය වෙනස් වී ඇත. ඒ වෙනුවට වෙනම ඇත්, අස්, සිංහ වශයෙන් පේළි තුනක් හෝ විටක සත්ත්ව පේළි දෙකක් දක්නට ලැබුණි. මෙහි සුවිශේෂිත්වය වන්නේ හින්දු ආගමික බලපෑම මත මෙම සත්ත්ව පේළියෙන් ගවයා ඉවත් වීමයි. පොළොන්නරු යුගයේ දී දක්නට ලැබෙන තවත් විශේෂ ලක්ෂණයක් වන්නේ ඇතැම් අවස්ථාවල දී සඳකඩපහණෙන් පසු පා තබන මුල් ම පියගැටයට ද කැටයම් එක්කර තිබීමයි. එසේ ම, සඳකඩපහණෙහි නිරූපිත අර්ධ පද්මය වැඩි ගැඹුරකින් යුතු ව කැටයම් කර ඇත. මෙම යුගයේ සඳකඩපහණෙහි සත්ත්වරූ කැටයම් ඉතාමත් ජවසම්පන්න ඉරියව්වලින් නිරූපිත වන අතර එක් එක් සත්ත්වයා විවිධ ඉරියව් නිරූපණය කරනු ලබයි. මෙම ජව සම්පන්න ඉරියව් හින්දු කලා ලක්ෂණවල සුලබ ව දක්නට ලැබෙන්නකි. එසේ ම මෙම කැටයම් ඉතාමත් අලංකාරත්මක ව සහ ලයාත්මක ව නෙළා ඇති ආකාරයක් ලියවැල් කැටයම් මඟින් දැක ගත හැකි ය. පොළොන්නරු සඳකඩපහණ අනුරාධපුර යුගයට වඩා ආකෘතිමය අතින් විශාල වෙනසකට ලක් වී ඇති බව පැහැදිලි ය. මෙම ආකෘතිමය වෙනස්වීම සඳහා එවකට පැවති හින්දු කලා සම්ප්‍රදාය හේතු පාදක වී ඇති බව ද ගම්‍යමාන වේ. ඉහත සාධක අනුව තහවුරු වන්නේ පොළොන්නරු යුගයේ සඳකඩපහණේ ආකෘතියේ සුවිශේෂී ලක්ෂණ ඇතිවීම කෙරෙහි හින්දු සංස්කෘතියේ බලපෑමක් මෙන් ම හින්දු-බෞද්ධ කලා සම්මිශ්‍රණයක් ද බලපා ඇති බවයි.

ප්‍රමුඛ පදඃ .සඳකඩපහණ, ලියවැල්, අර්ධ පද්මය, කැටයම්

---

*1 දෘශ්‍යකලා හා සැලසුම්කරණය (විශේෂවේදී) ප්‍රථම වසර* dulangaliyanage90@gmail.com
*2 දෘශ්‍යකලා හා සැලසුම්කරණය (විශේෂවේදී) ප්‍රථම වසර* wijethungasandeepani@gmail.com